# පුස්තකාලය - කොළඹ විශ්වවිද්‍යාලය

## ආරක්ෂක උපදෙස් මාලාව

**<u>තම ආරක්ෂාව පිණිස පහත සඳහන් උපදෙස් නිසි පරිදි පිළිපදින ලෙස සියලුම පුස්තකාල පාඨක ප්‍රජාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.</u>**

- පුස්තකාලයට ඇතුළුවීමේදී විශ්වවිද්‍යාලයීය නිල හැඳුනුම්පත (ශිෂ්‍ය/කාර්යමණ්ඩල) ඉදිරිපත් කිරීම අනිවාර්ය හෙයින් සෑම විටම එය රැගෙන ආ යුතුය.
- නැවත දන්වන තුරු සතියේ දිනවල එනම් සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු 8.30 සිට පස්වරු 4.00 දක්වා පුස්තකාලය විවෘතව පවතින අතර (සති අන්තයේ සහ රජයේ නිවාඩු දිනවලදී පුස්තකාලය වසා තැබේ) බිම් මහලේ කියවීම් ශාලාව (Learning Commons) වසා තැබේ.
- විමර්ශන ග්‍රන්ථ දිනපතා පෙරවරු 8.30 සිට පස්වරු 3.30 නිකුත් කෙරෙන අතර නැවත භාරදීම සඳහා දෙනු ලබන කාලය දින දෙකක් දක්වා දීර්ඝ කර ඇත.
- ඔබගේ බඩුබාහිර ආදිය පුස්තකාල දොරටුව හෝ ඒ ආශ්‍රිතව නොතැබිය යුතු අතර, ඒ සඳහා පුස්තකාලය පිටුපස ඇති "බඩුබාහිර ආදිය තබන කාමරය"(Cloak Room) භාවිත කළ යුතුය
- හදිසි අවස්ථාවකදී විදුලි සෝපාන (Lifts) භාවිත කිරීමෙන් වැළකී, තරප්පුපෙළ වෙත ළඟාවීමේ සංඥා  අනුගමනය කර පිටවිය යුතුය.
- හැකි ඉක්මනින් පුස්තකාලයෙන් පිටවන ලෙස දන්වමින් හෝ පුස්තකාලය මගින් පණිවිඩයක් දෙනුලබන අවස්ථාවලදී හෝ විශේෂිත සීනුවක් නාද කෙරෙන හෙයින් සාවධානව සිටින්න.
- හදිසි අවස්ථාවක පාඨකයින් ඉවත් කිරීමකදී, බිම් මහලේ හෝ පළමු මහලේ ඇති හදිසි පිටවීමේ දොරටු (Emergency Exits) භාවිත කළ යුතුය.
- නැවත දන්වනතුරු පහත සඳහන් ද්‍රව්‍ය (විශේෂයෙන්ම) පුස්තකාලය තුළට රැගෙන ඒමට අවසර නොලැබේ: **ජලය/වෙනත් පානීය ද්‍රව්‍ය හෝ දියර, බෝතල්, ලැප්ටොප් පරිගණක හෝ වෙනත් විද්‍යුත් උපාංග, බැටරි වර්ග (ආරෝපණය කළහැකි හෝ නොහැකි), විදුලි ආරෝපක උපකරණ (Chargers), විදුලි රැහැන් (Wires), දාහකයන් (Lighters), තියුණු තල සහිත (පිහි, කතුරු ආදී) උපකරණ, ලෝහ හා ප්ලාස්ටික් පැන්සල් පෙට්ටි ඇතුළුව, ගිනිපෙට්ටි, සබන්, සුවඳ විලවුන්, ජෙල් වර්ග, සියලු වර්ගයේ ඖෂධ, ඔක්සිකරණ උපකරණ සහ කාබනික සංයෝග, අනෙකුත් රසායන ද්‍රව්‍ය, චුම්බක (Magnetic) ද්‍රව්‍ය**
- ඔබ සතු බඩුබාහිර ආදිය පුස්තකාලය තුළ දමා යෑමෙන් වැළකිය යුතුය.
- කොරිඩෝව අවහිර කිරීමෙන් හෝ ඒ තුළ රැඳී සිටීමෙන් වැළකිය යුතුය.
- පුස්තකාලය තුළ හෝ ඒ අවට ඡායාරූප ගැනීම හෝ (ස්ව ඡායාරූ/Selfies ඇතුළත්ව) රූගත කිරීම (Video) සඳහා අවසර දෙනු නොලැබේ
- පුස්තකාලය තුළ හෝ ඒ අවට සැකකටයුතු පුද්ගලයෙක්, ක්‍රියාවක්, ලේඛනයක්, හෝ ඉහත තහනම් කර ඇති ද්‍රව්‍යයක්/ක්‍රියාවක් ඔබ දුටුවහොත් වහාම **පුස්තකාලයාධිපතිනිය (0714434638), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති පාඨකසේවා-2 (0718393111)** හෝ **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී පුස්තකාල සේවා (0713894325)** වෙත දැන්වීමට පසුබට නොවන්න

ඔබට මුහුණ දීමට සිදුවන අපහසුතා පිළිබඳ අපගේ කණගාටුව!

..........................................

පුස්තකාලයාධිපතිනි